# මියුසියස් විද්‍යාලය

අධ්‍යයන ලිපි ගොනුව 2 / දෙවන සතිය /2020

ශ්‍රේණිය: 7 විෂය : **පුරවැසි අධ්‍යාපනය** මාධ්‍යය: සිංහල

---

පාඩම 1:

**<u>දත්ත හා තොරතුරු වල අවශ්‍යතාවය</u>**

**දත්ත යනු මොනවාද?**

කිසියම් විශය ක්ෂේත්‍රයක් හා සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරන මූලාශ්‍ර දත්ත නම් වේ.

දත්ත එක් රැස් කරන අවස්ථා මොනවාද?

උදා: 1. පාසල් ඇගයීමකට අවශ්‍ය තොරතුරු රැස් කිරීමේදී

2. රටේ කාලීන තොරතුරු පිළිබඳව අධ්‍යයනය කිරීමේදී

වර්තමාන ලෝකයේ දත්ත රැස්කළ හැකි මාධ්‍ය විශාල සංඛ්‍යාවක් ඇත.

උදා: අන්තර්ජාලය
රූපවාහිනිය
ගුවන්විදුලිය
පුවත්පත්
සමාජ වෙබ් අඩවි

විවිධ අවස්ථා වලදී ඒවා නිවැරදිව හා විචාරශීලීව පරිහරණය කිරීම වැදගත් වේ.

දත්ත හා තොරතුරු යනු ලිඛිත දේ පමණක් නොව අපගේ ජීවන අත්දැකීම් ද ඵලදායී දත්ත හා තොරතුරු වේ.

**ප්‍රශ්න**

**01. දෛනිකව ඉදිරිපත් කෙරෙන අපට අත්‍යවශ්‍ය වන තොරතුරු මොනවාද?**



Musaeus College

## පාඩම 2:

**<u>විවිධ සංසිද්ධීන් වලට සාර්ථකව මුහුණ දීම</u>**

- ජීවිත කාලය තුළ විවිධ සංසිද්ධීන්ට මුහුණ පෑමට සිදුවේ.
- මෙම අවස්ථාවන් විවිධාකාර බැවින් ඒවාට මුහුණ දෙන ආකාරයද විවිධ වේ.

**ප්‍රශ්න**

**01. ඔබ මුහුණ පා ඇති විවිධ අවස්ථා කිහිපයකට උදහරණ ලියන්න.**

- ඇතැම් ගැටලුමය අවස්ථාවන් වලට මුහුණ දීමේදී ඒ සඳහා ඔබ මුහුණ දෙන ආකාරය පිළිබඳව ඔබ ඔබගේ මනසින් අසා දැනගත යුතුය.

- ගැටලු ඇතිවූ විට එම අභියෝග වලින් ඵලා නොයා ඒවාට සාර්ථකව මුහුණ දිය යුතුය.ඔනෑම ගැටලුවක් සඳහා විකල්ප විසඳුම් කිහිපයක් ඇත.

**ප්‍රශ්න**
**01.ඔබ මුහුණ දුන් අභියෝගාත්මක අවස්ථා මොනවාද?**

**02.එම අවස්ථාවන්ට මුහුණ පෑමේදි ඔබ තුළ ඇතිවූ අඩුපාඩුකම් මොනවාද?**

**03.එම අවස්ථා වලට මුහුණ දීම සඳහා ඔබ භාවිතා කළ විකල්ප විසඳුම් මොනවාද?**

සැකසුම: ඉන්දීවරී පියතිලක මිය

Musaeus College